**ශීර්ෂය 213 - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 213 - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, වාණිජ අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූලි 14 දින දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම, වාණිජ අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 111.30 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 96.65 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 14.65 ක් හෙවත් සියයට 13.16 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 55.40 | 47.26 | 8.14 | 14.69 |
| මූලධන | 55.90 | 49.39 | 6.51 | 11.65 |
| **එකතුව** | **111.30** | **96.65** | **14.65** | **13.16** |

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 21301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 6.93 | 6.84 | 5.43 | 6.34 | 33.00 | 17.92 |

### 2.2.2 වාණිජ අත්තිකාරම් ගිණුම

දෙපාර්තමේන්තුව විසින් වාණිජ අත්තිකාරම් ගිණුමක් පවත්වා තිබුණි.

**(අ) පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුව විසින් පවත්වා තිබුණු විෂය අංක 21302 දරන වාණිජ අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | | බැරකම් | |
|---|---|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 3,950.00 | 3,931.82 | 3,000.00 | 4,038.81 | 4,000.00 | 803.51 | 2,500.00 | 2,499.90 |

**(ආ) මූල්‍ය ප්‍රතිඵල**

වාණිජ අත්තිකාරම් ගිණුමේ මූල්‍ය ප්‍රතිඵල පහත පරිදි විය

| විෂය අංකය | අත්තිකාරම් ගිණුම් කටයුත්ත | මූල්‍ය ප්‍රතිඵල | | | |
|---|---|---|---|---|---|
| | | 2015 | | 2014 | |
| | | ලාභය කල්පිත ගාස්තු රහිතව | ලාභය කල්පිත ගාස්තු සහිතව | ලාභය කල්පිත ගාස්තු රහිතව | (පාඩුව) කල්පිත ගාස්තු සහිතව |
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 21302 | පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය | 2,034.1 | 1,171.4 | 262.6 | (665.7) |

## 2.3 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වන අග්‍රිම ගිණුම් 3 කට අදාළව 2015 දෙසැම්බර් 31 දින වන විට ශේෂ එකතුව රු.මිලියන 3.97 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0088/000 | 3.10 |
| 6000/0000/00/0013/0078/000 | 0.34 |
| 6000/0000/00/0016/0066/000 | 0.53 |
| **එකතුව** | **3.97** |

## 2.4 විගණන නිරීක්ෂණය

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, වාණිජ අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

විෂය අංක 21301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය අනුව අයකර ගැනීමට නොහැකි වූ හා කපාහැරීමට කටයුතු නොකල ශේෂය රු.538,290 ක් වූ අතර එය වර්ෂ 01 ක සිට වර්ෂ 05 ක් දක්වා වූ කාල පරාසයක සිට පැවත එමින් තිබුණි.

## 3.2 වාණිජ අත්තිකාරම් ගිණුම

----------------------------

සමාලෝචිත වර්ෂයේදි දෙපාර්තමේන්තුව විසින් විෂය අංක 21302 දරන පොත් මුද්‍රණය, ප්‍රචාරණය, අලෙවිය පිළිබඳව වාණිජ අත්තිකාරම් කාර්යයක කටයුතු ඉටු කර තිබුණි. විගණනය වෙත ඉදිරිපත් කළ එම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2015 වර්ෂය සඳහා වූ අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් විගණන මතයක් ප්‍රකාශකළ නොහැකි වූ අතර, ඉකුත් වර්ෂවල ගිණුම් සම්බන්ධයෙන්ද විගණන මතයක් ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) අත්තිකාරම් ගිණුමේ අයවීම් හිඟහිට තිබූණු ශේෂවල එකතුව රු.632,557 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. ඉන් රු.28,996 ක් වූ ශේෂය කපාහැරීම සඳහා 2016 ජූලි 15 දින අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ලැබී තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තු වැය ලෙජරවලට අනුව එකතුව රු.3,909,742,737 ක් වූ මුළු වියදම එක් එක් මාසවලදී පළාත් වියදම් වශයෙන් හඳුනාගෙන විභජනය කිරීමකින් තොරව මාසික මුළු වියදම එක් පළාත් විකුණුම් ගිණුමකට හරකර තිබුණි.

(ඈ) 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය අවසාන වන විට රජයේ පාසල්වලට නොමිලේ පෙළපොත් බෙදාහැරීම සඳහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන ලබාදී තිබුණද, එම පොත්වල වටිනාකම වූ රු.9,662,075,550 ක ණයගැති ශේෂයක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ඉ) මුදල් රෙගුලාසි 504 ප්‍රකාරව එක් එක් කාර්තුව අවසානයේ වෙළඳ ණයගැති, ණයහිමි, නිමිභාණ්ඩ, භාණ්ඩ හා සැපයුම් ප්‍රකාශයක්ද, අත්තිකාරම් ගිණුම් සීමාවන් පිළිබඳ ප්‍රකාශයක්ද, ලාභ අලාභ ගිණුමක්ද පිළියෙල කර විගණකාධිපතිට පිටපතක් සහිතව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට ඉදිරිපත් කළ යුතු වුවත්. 2016 මාර්තු 31 දින වන විටත් එසේ කටයුතු කර නොතිබුණි.

(ඊ) දෙපාර්තමේන්තුවේ මුදල් ප්‍රවාහනය කිරීමේදී මුදල් රෙගුලාසි 326 ප්‍රකාරව සරප් හෝ වගකිව යුතු නිලධාරයෙකු පොලිස් ආරක්ෂාව සහිතව යා යුතු වුවත්, වාණිජ අත්තිකාරම් කාර්යයෙහි විකුණුම් ආදායම රු.200,000 ඉක්මවූ දිනවල හා විකුණුම් ආදායම රු.600,000 ඉක්මවා තිබුණු විශේෂිත දිනවලද මුදල් ප්‍රවාහනය කිරීමේදී එසේ කටයුතු කර නොතිබුණි.

(උ) 2015 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ වාණිජ අත්තිකාරම් ගිණුමට අදාළව 2004 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා සමුච්චිත ලාභය රු.6,732,120,091 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ ලාභය වූ රු.2,034,156,417 ක් වී තිබුණි. මුදල් රෙගුලාසි 510(2)(ආ) ප්‍රකාරව එම ලාභ රජයේ ආදායමට පවරා නොතිබුණි.

## 3.3 කළමනාකරණ දුර්වලතා

---------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) 2008 වර්ෂයේ මුද්‍රණය කරන ලද රු.1,127,775 ක් වටිනා උපපත්‍රිකා පොත් 6,835 ක ප්‍රමාණයක් 2015 වර්ෂය වන විටත් භාවිතා කරනු ලබන අතර ඉන් සියයට 30 ක ප්‍රමාණයක් 2015

දෙසැම්බර් 31 දින වන විටත් ඉතිරිව තිබුණි. අනවශ්‍ය පරිදි ඉන්වොයිස් පොත් මුද්‍රණය කිරීමෙන් විශාල ගබඩා ඉඩ ප්‍රමාණයක් අවශ්‍ය වීම, පොත්වලට හානි සිදුවීම, පොත් අවභාවිතයට ඉඩ සැලැස්වීම වැනි කරුණු කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. එසේම අස්ථානගත වූ පරිහරණය කළ හා නොකළ රු.1,127,775 ක් වටිනා උපපත්‍රිකා පොත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 343 ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2016 වර්ෂයට පෙළපොත් 409 ක් සඳහා පිටපත් 44,073,100 ක් මුද්‍රණය වෙනුවෙන් රාජ්‍ය හා පෞද්ගලික අංශ වෙත රු. 3,651,746,650 ක් ගෙවා තිබුණි. 2015 මැයි 28 දිනැති අංක අමප/15/0597/622/002-1 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව පෙළපොත් මුද්‍රණය කිරීමේදී සියයට 30 ක ප්‍රමාණයක් රාජ්‍ය අංශය වෙත පිරිනැමිය යුතුව තිබුණි. 2016 වර්ෂය වෙනුවෙන් මුද්රණය කරන ලද පෙළපොත් ප්‍රමාණයෙන් රාජ්‍ය අංශයට සියයට 20 ක් පමණක් ලබාදී තිබුණි. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් විසින් නියමිත කාලපරිච්ඡේදය තුළ පෙළපොත් මුද්‍රණය කළයුතු බවත්, ඉකුත් වර්ෂවල කාර්යභාරය පදනම් කර ගෙන පෙළපොත් මුද්‍රණය භාරදී ඇති බව විගණනයට දන්වා තිබුණද, පෞද්ගලික අංශයේද නියමිත කාලය තුළ මුද්‍රණ කටයුතු සිදුකර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය.

(ඇ) පොත්වල ගුණාත්මක තත්ත්වය පිළිබඳව පරීක්ෂණ වාර්තා ලබාගැනීමට පරීක්ෂණාගාරයක් පැවතියත්, එහි පුහුණු පරීක්ෂණ නිලධාරියෙකු නොමැතිවීම හේතුවෙන් නිවැරදි වාර්තා ලබාගැනීමට නොහැකි වී තිබුණි. විගණනය විසින් කාර්මික තාක්ෂණ ආයතනය වෙතින් පොත් වර්ග 6 ක් සඳහා තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ලබාගත් අතර අයිතම් 5 ක ආතන්‍ය ප්‍රභලතාව (Tensile Index) නොතිබූ අතර එක් අයිතමයක කඩදාසියේ ප්‍රභාවය (Brightness) නොතිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කමිටුව විසින් පෙළපොත් පිටපත් 7,407,500 ක් වෙනුවෙන් රු.407,600,350 ක දඩ මුදල් නිදහස් කර තිබුණි. මෙම වටිනාකමින් සියයට 12 ක් රාජ්‍ය අංශයෙන්ද, සියයට 88 ක් පෞද්ගලික අංශයෙන්ද නිදහස් කර තිබූ අතර දඩ නිදහස් කිරීමට තුඩුදුන් පිළිගත හැකි හේතු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) දැනුම පදනම් කරගත් ආර්ථිකයක් සඳහා මානව ප්‍රාග්ධන ව්‍යාපෘතිය (TSEP) සඳහා මිලියන 20 ක් වෙන් කර තිබූ අතර එමඟින් කාර්යයන් 5 ක් ඉටුකිරීමට සැලසුම් කර තිබුණි. ඉන් කාර්යයන් 2 ක් පමණක් ඉටුකර තිබූ අතර ව්‍යාපෘතිය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන රු. මිලියන 5.6 ක් ඉතිරි වී තිබුණි.

**3.4** **මානව සම්පත් කළමනාකරණය**

**------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**------------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** | **අතිරික්ත සංඛ්‍යාව** |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 45 | 40 | 05 | - |
| (ii) | තෘතියික මට්ටම | 04 | 03 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 120 | 74 | 46 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 73 | 175 | - | 102 |
| | **එකතුව** | **242** | **292** | **52** | **102** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට තනතුරු 52 ක් පුරප්පාඩුව පැවති අතර එම පුරප්පාඩු පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොත් මුද්‍රණය කිරීමේදී ප්‍රමාණවත් නිලධාරීන් නොමැති වීමෙන් සිදුවූ ප්‍රමාදය හේතුවෙන් මුද්‍රණ හිමිකරුවන්ගෙන් අය කරගත යුතු දඩ මුදල් නිදහස් කිරීමට සිදුවී තිබුණි.

(ආ) ව්‍යාපෘතියෙහි කාර්යයන් ඉටුකිරීම සඳහා සැලැසුම් සම්පාදනය කර තිබුණද, ඒවා ඉටුකිරීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොතිබුණි.